# ටෙන්ඩර් අයදුම්පත්‍රය

**කොළඹ මහා නගර සභාව – නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව**

**පොදු වෙළඳපොළවල වෙළඳසැල් කුලී පදනම මත ලබාදීම සඳහා ටෙන්ඩර් කැඳවීම.**

.................................................පොදු වෙළඳපළ - අංක ............... දරණ ..........................වෙළඳසැල

ඉහත සඳහන් පොදු වෙළඳපොළ වෙළඳසැල් වසර 10 ක් සඳහා කුලී පදනම මත ලබා ගැනීම සඳහා වූ ටෙන්ඩර් ලියකියවිලි කියවා බැලීමෙන් පසු ඊට අනුකූලව පනවා ඇති කොන්දේසි පරිදි රු.......................................................................................(1) (රු ...............................(2) ක් වූ ටෙන්ඩර් ගාස්තුවක් මත, කොළඹ මහා නගර සභාවට අයත් ...............................................(3) පොදු වෙළඳපොළ අංක .............................(4) දරණ .............................(5) වෙළඳසැල, කුලී පදනම මත ලබා ගැනීම සඳහා ..................................................................................................(6) හි පදිංචි ..................................................................................................................(7) වන මා (...............................................(8) විසින් ටෙන්ඩර් ඉදිරිපත් කරමි.

1. මා මෙම ටෙන්ඩරය ඉදිරිපත් කරනු ලබන්නේ මා වෙනුවෙන් විනා වෙනත් අයෙකුගේ නාමිකයෙකු හෝ නියෝජිතයෙකු වශයෙන් නොවන බව මා මෙයින් ප්‍රකාශ කර සිටිමි.
2. මා විසින් පිටු අංක 02 සිට 05 දක්වා වූ ටෙන්ඩරයේ කොන්දේසි හා උපදෙස් කියවා දැනුවත් වූ අතර, මා වෙත ටෙන්ඩරය ප්‍රදානය කරන ලද්දේ නම්, වර්ෂ 10 ක කාලයක් සඳහා මෙම කොන්දේසි වලට අදාලව, ඒවායින් සම්පූර්ණයෙන්ම බැඳීමට මාගේ කැමැත්ත ප්‍රකාශ කර සිටිමි.
3. මෙම ටෙන්ඩර් කටයුත්තට අදාලව අවසාන තීරණය ගැනීම කොළඹ මහා නගර සභාව සතු බව මා දැනුවත් බව ද, ඊට එකඟ බව ද ප්‍රකාශ කරමි.
4. මා විසින් මෙම ටෙන්ඩරයෙහි ලබා දී ඇති සියලු තොරතුරු සත්‍ය සහ නිවැරදි වන අතර, මා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සාවද්‍ය වන්නේ නම්, එය මාගේ ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීමට හේතුවන බව මම හොඳාකාරව දනිමි.

ටෙන්ඩර්කරුගේ අත්සන ....................................................................................................

දිනය ........................................... දුරකථන / ෆැක්ස් අංක .....................................

**සාක්ෂි**

1. ........................................................ 2. ..........................................................

නම ....................................................... ..........................................................

ලිපිනය ....................................................... ..........................................................

අයදුම්පත් ගාස්තු රිසිට් අංකය .................................................................... දිනය.......................................

ටෙන්ඩර් තැන්පත් ගාස්තුව.......................................................................... දිනය.....................................

නිකුත් කළ නිළධාරියා..............................................................................

.................................................................................

ගණකාධිකාරි/ ප්‍ර.ක.සේ.නි

# කොළඹ මහා නගර සභාව

## නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව

### නාගරික පොදු වෙළඳපොළ වෙළඳසැල්

### කුලී පදනම මත පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවීම - 2022

## පටුන


1. ටෙන්ඩර් කිරීමට නියමිත වෙළඳසැල් උපලේඛනය.......................... පිටු අංක 03-07
2. ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කිරීම.......................................................... පිටු අංක 08
3. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්......................................... පිටු අංක 09
4. ටෙන්ඩර් ඇගයීම.......................................................................................... පිටු අංක 10
5. ටෙන්ඩරය පිරිනැමීම.................................................................................. පිටු අංක 11
6. කුලී ගෙවීම.................................................................................................... පිටු අංක 12
7. බලපත්‍ර නිකුත් කිරීම.................................................................................. පිටු අංක 13
8. සාමාන්‍ය කොන්දේසි.................................................................................. පිටු අංක 13
9. විශේෂ කරුණු............................................................................................. පිටු අංක 14


<u>ටෙන්ඩර් කිරීමට නියමිත වෙළඳසැල් උපලේඛනය</u>

| අනු අංකය | | වෙළඳසැල් අංකය | වෙළඳ ස්වභාවය | 2021 නව කුලී මුදල රු.ශත | ටෙන්ඩරයේ අවම මුදල රු.ශත |
|---|---|---|---|---|---|
| 1 | කොටහේන | 5/1/19 | සාප්පු | 9,200.00 | 552,000.00 |
| 2 | කිරුළපන | 97 | මාළු | 6,500.00 | 390,000.00 |
| 3 | | 98 | මාළු | 6,500.00 | 390,000.00 |
| 4 | ෆසල්ස් පටුමග | ශාලා අංක 01 | | 81,000.00 | 5,000,000.00 |
| 5 | | ශාලා අංක 02 | | 64,000.00 | 4,000,000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6 | කොස්ගස්හංදිය | 10/05 | මාළු | 6,000.00 | 150,000.00 |
| 7 | | 10/06 | මාළු | 6,000.00 | 150,000.00 |
| 8 | | 10/07 | මාළු | 6,000.00 | 150,000.00 |
| 9 | | 10/17 | එළවළු | 6,000.00 | 150,000.00 |
| 10 | | 10/18 | එළවළු | 6,000.00 | 150,000.00 |
| 11 | | 10/19 | එළවළු | 6,000.00 | 150,000.00 |
| 12 | | 10/20 | එළවළු | 6,000.00 | 150,000.00 |
| 13 | | 10/21 | එළවළු | 6,000.00 | 150,000.00 |
| 14 | | 10/22 | එළවළු | 6,000.00 | 150,000.00 |
| 15 | | 10/23 | එළවළු | 6,000.00 | 150,000.00 |
| 16 | | 10 /1/1 | එළවළු | 3,250.00 | 75,000.00 |
| 17 | | 10/ 1/89 | සාප්පු | 7,500.00 | 250,000.00 |
| 18 | | 10/1/90 | සාප්පු | 7,500.00 | 250,000.00 |
| 19 | | 10/ 1/91 | සාප්පු | 7,500.00 | 250,000.00 |
| 20 | | 10 / 1/92 | සාප්පු | 7,500.00 | 250,000.00 |
| 21 | | 10 /1/94 | සාප්පු | 7,500.00 | 250,000.00 |
| 22 | | 10/1/95 | සාප්පු | 7,500.00 | 250,000.00 |
| 23 | වැල්ලවත්ත | 18/A | එළවළු/පළතුරු | 2,000.00 | 120,000.00 |
| 24 | | 22/A | එළවළු/පළතුරු | 2,000.00 | 120,000.00 |
| 25 | | 26/A | එළවළු/පළතුරු | 2,000.00 | 120,000.00 |
| 26 | | 29/A | එළවළු/පළතුරු | 2,000.00 | 120,000.00 |
| 27 | | 31/A | එළවළු/පළතුරු | 2,000.00 | 120,000.00 |
| 28 | | 36/A | එළවළු/පළතුරු | 2,000.00 | 120,000.00 |
| 29 | | 37/A | එළවළු | 2,000.00 | 120,000.00 |
| 30 | | 03/B | එළවළු/පළතුරු | 2,500.00 | 150,000.00 |
| 31 | | 06/B | එළවළු/පළතුරු | 2,500.00 | 150,000.00 |
| 32 | | 07/B | එළවළු/පළතුරු | 2,500.00 | 150,000.00 |
| 33 | | 13/B | එළවළු/පළතුරු | 2,500.00 | 150,000.00 |
| 34 | | 14/B | එළවළු/පළතුරු | 2,500.00 | 150,000.00 |
| 35 | | 15/B | එළවළු | 2,500.00 | 150,000.00 |
| 36 | | 16/B | එළවළු | 2,500.00 | 150,000.00 |
| 37 | | 1 | ග්‍රොසරි/සාප්පු | 13,650.00 | 819,000.00 |
| 38 | | 3 | සාප්පු | 13,650.00 | 819,000.00 |
| 39 | | 4 | සාප්පු | 13,650.00 | 819,000.00 |
| 40 | | 5 | සාප්පු | 13,650.00 | 819,000.00 |
| 41 | | 6 | සාප්පු | 13,650.00 | 819,000.00 |
| 42 | | 7 | සාප්පු | 13,650.00 | 819,000.00 |
| 43 | | 8 | සාප්පු | 13,650.00 | 819,000.00 |
| 44 | | 1 | මාළු | 7,050.00 | 423,000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 45 | බම්බලපිටිය | 1 | එළවළු | 2,500.00 | 150,000.00 |
| 46 | | 3 | එළවළු | 2,500.00 | 150,000.00 |
| 47 | | 5 | මාළු | 1,620.00 | 97,200.00 |
| 48 | | 6 | මාළු | 1,620.00 | 97,200.00 |
| 49 | | 10 | එළවළු | 2,500.00 | 150,000.00 |
| 50 | ජාතික පොළ | 78 | පලතුරු | 720.00 | 43,200.00 |
| 51 | ඕන්ස්පාර | 34 | වියලිද්‍රව්‍ය | 3,150.00 | 189,000.00 |
| 52 | | 40 | වියලිද්‍රව්‍ය | 1,620.00 | 97,200.00 |
| 53 | | 44/1/23 | වියලිද්‍රව්‍ය | 2,520.00 | 151,200.00 |
| 54 | | 44/2/53 | වියලිද්‍රව්‍ය | 1,620.00 | 97,200.00 |
| 55 | | 44/32 | මාළු | 5,160.00 | 309,600.00 |
| 56 | | 44/28 | මාළු | 5,280.00 | 316,800.00 |
| 57 | | 44/27 | මාළු | 5,400.00 | 324,000.00 |
| 58 | | 44/26 | මාළු | 5,160.00 | 309,600.00 |
| 59 | බොරැල්ල | 7/B/15 | සාප්පු | 6,900.00 | 414,000.00 |
| 60 | | 7/18 | එළවළු | 1,800.00 | 108,000.00 |
| 61 | | 7/38 | එළවළු | 12,600.00 | 756,000.00 |
| 62 | | 7/39 | | | |
| 63 | | 7/40 | | | |
| 64 | | 7/42 | | | |
| 65 | | 7/43 | | | |
| 66 | | 7/48 | වියලි ද්‍රව්‍ය | 4,000.00 | 240,000.00 |
| 67 | | 7/50 | වියලි ද්‍රව්‍ය | 4,000.00 | 240,000.00 |
| 68 | | 7/51 | සාප්පු | 10,100.00 | 606,000.00 |
| 69 | | 7/52 | | | |
| 70 | | 7/54 | එළවළු | 7,200.00 | 432,000.00 |
| 71 | | 7/55 | | | |
| 72 | | 7/56 | එළවළු | 3,100.00 | 186,000.00 |
| 73 | | 7/57 | එළවළු | 3,100.00 | 186,000.00 |
| 74 | | 7/1/23 | එළවළු | 7,200.00 | 432,000.00 |
| 75 | | 7/1/37 | සාප්පු | 7,200.00 | 432,000.00 |
| 76 | | 7/1/38 | සාප්පු | 7,200.00 | 432,000.00 |
| 77 | | 7/1/43 | සාප්පු | 10,200.00 | 612,000.00 |
| 78 | | 7/1/44 | | | |
| 79 | | 7/1/50 | සාප්පු | 6,500.00 | 390,000.00 |
| 80 | | 7/1/51 | සාප්පු | 7,000.00 | 420,000.00 |
| 81 | | 7/1/52 | සාප්පු | 5,500.00 | 330,000.00 |
| 82 | | 7/1/53 | සාප්පු | 7,000.00 | 420,000.00 |
| 83 | | 7/1/56 | සාප්පු | 7,000.00 | 420,000.00 |
| 84 | | 7/1/57 | සාප්පු | 7,800.00 | 468,000.00 |
| 85 | | 7/1/59 | සාප්පු | 7,000.00 | 420,000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 86 | | 7/1/60 | සාජපු | 7,000.00 | 420,000.00 |
| 87 | | 7/1/61 | සාජපු | 7,800.00 | 468,000.00 |
| 88 | | 7/1/62 | | | |
| 89 | | 7/1/63 | සාජපු | 28,100.00 | 1,686,000.00 |
| 90 | | 7/1/64 | | | |
| 91 | බොරැල්ල | 7/1/66 | සාජපු | 9,400.00 | 564,000.00 |
| 92 | | 7/1/69 | සාජපු | 4,800.00 | 288,000.00 |
| 93 | | 7/1/73 | සාජපු | 10,900.00 | 654,000.00 |
| 94 | | 7/1/76 | සාජපු | 5,400.00 | 324,000.00 |
| 95 | | 7/2/2F | සාජපු | 10,400.00 | 624,000.00 |
| 96 | | 7/2/2G | | | |
| 97 | | 7/2/2H | සාජපු | 34,500.00 | 2,070,000.00 |
| 98 | | 7/2/2J | | | |
| 99 | | 7/2/2M | | | |
| 100 | | 7/2/2R | සාජපු | 3,600.00 | 216,000.00 |
| 101 | | 7/2/4 | සාජපු | 5,900.00 | 354,000.00 |
| 102 | | 7/2/27 | සාජපු | 5,100.00 | 306,000.00 |
| 103 | | 7/2/31 | සාජපු | 6,400.00 | 384,000.00 |
| 104 | | 7/2/34 | සාජපු | 6,400.00 | 384,000.00 |
| 105 | | 7/2/36 | සාජපු | 5,500.00 | 330,000.00 |
| 106 | | 7/2/37 | සාජපු | 5,500.00 | 330,000.00 |
| 107 | | 7/2/51 | සාජපු | 8,500.00 | 510,000.00 |
| 108 | | 7/2/52 | සාජපු | 6,800.00 | 408,000.00 |
| 109 | | 7/2/53 | සාජපු | 7,600.00 | 456,000.00 |
| 110 | | 7/2/56 | සාජපු | 4,900.00 | 294,000.00 |
| 111 | | 7/2/66 | සාජපු | 12,700.00 | 762,000.00 |
| 112 | | 7/3/7 | සාජපු | 11,600.00 | 696,000.00 |
| 113 | | 7/3/8 | | | |
| 114 | | 7/3/12 | | | |
| 115 | | 7/3/14 | සාජපු | 22,700.00 | 1,362,000.00 |
| 116 | | 7/3/15 | | | |
| 117 | | 7/3/16 | සාජපු | 5,600.00 | 336,000.00 |
| 118 | | 7/3/17 | සාජපු | 7,800.00 | 468,000.00 |
| 119 | | 7/3/21 | සාජපු | 10,900.00 | 654,000.00 |
| 120 | | 7/3/22 | සාජපු | 5,500.00 | 330,000.00 |
| 121 | | 7/3/27 | සාජපු | 3,400.00 | 204,000.00 |
| 122 | | 7/3/28 | සාජපු | 3,400.00 | 204,000.00 |
| 123 | | 7/3/30 | සාජපු | 5,300.00 | 318,000.00 |
| 124 | | 7/3/31 | සාජපු | 5,300.00 | 318,000.00 |
| 125 | | 7/3/37 | සාජපු | 13,400.00 | 804,000.00 |
| 126 | | 7/3/37A | | | |
| 127 | | 7/3/39 | සාජපු | 7,700.00 | 462,000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 128 | | 7/3/40 | සාජපු | 7,700.00 | 462,000.00 |
| 129 | | 7/3/41 | සාජපු | 7,700.00 | 462,000.00 |
| 130 | | 7/3/42 | සාජපු | 7,700.00 | 462,000.00 |
| 131 | | 7/3/43 | සාජපු | 7,700.00 | 462,000.00 |
| 132 | බොරැල්ල | 7/3/44 | සාජපු | 7,700.00 | 462,000.00 |
| 133 | | 7/3/45 | සාජපු | 22,300.00 | 1,338,000.00 |
| 134 | | 7/3/46 | | | |
| 135 | | 7/3/55 | | | |
| 136 | | 7/3/56 | | | |
| 137 | | 7/3/47 | සාජපු | 21,600.00 | 1,296,000.00 |
| 138 | | 7/3/48 | | | |
| 139 | | 7/3/53 | | | |
| 140 | | 7/3/54 | | | |
| 141 | | 7/3/49 | සාජපු | 11,800.00 | 708,000.00 |
| 142 | | 7/3/50 | | | |
| 143 | | 7/3/51 | සාජපු | 8,800.00 | 528,000.00 |
| 144 | | 7/3/52 | | | |
| 145 | | 7/3/57 | සාජපු | 49,000.00 | 2,940,000.00 |
| 146 | | 7/3/58 | | | |
| 147 | | 7/3/66 | | | |
| 148 | | 7/3/69 | | | |
| 149 | | 7/3/70 | | | |
| 150 | | 7/3/71 | | | |
| 151 | | 7/3/67 | සාජපු | | |
| 152 | | 7/3/68 | | 16,700.00 | 1,002,000.00 |
| 153 | | 7/3/60 | සාජපු | 24,100.00 | 1,446,000.00 |
| 154 | | 7/3/61 | | | |
| 155 | | 7/3/62 | | | |
| 156 | | 7/3/63 | සාජපු | 7,800.00 | 468,000.00 |
| 157 | | 7/3/82 | සාජපු | 19,000.00 | 1,140,000.00 |
| 158 | | 7/3/89 | සාජපු | 8,800.00 | 528,000.00 |

## කොළඹ මහ නගර සභාව

## නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව

කොළඹ මහා නගර සභාවට අයත් පොදු වෙළඳපොළවල හිස් ව පවතින, මේ සමඟ අමුණා ඇති උපලේඛනයෙහි දැක්වෙන වෙළඳසැල් **වසර 10 ක කාලයක් සඳහා**, කුලී පදනම මත ලබා දීම සඳහා මුද්‍රා තබන ලද පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් කැඳවනු ලැබේ.

**1. ටෙන්ඩර් අයදුම්පත්‍ර නිකුත් කිරීම**

**2022.01.19 සිට 2022.02.09 දින පෙ.ව.9.00 සිට ප.ව. 3.00 දක්වා ටෙන්ඩර් ලියවිලි ( මුල් පිටපත හා අනු පිටපත) දෙආකාරයකින් ලබා ගත හැක.**

**ක්‍රමය 01 –** කොළඹ මහා නගර සභාවේ www.colombo.mc.gov.lk නිල වෙබ් අඩවියෙන් බාගත කර ගැනීම.

I. අයදුම්පත්‍ර ගාස්තුව වන රු 1080.00 ක මුදල පහත දෙ ආකාරයෙන් ගෙවිය හැකිය.

a) මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් , පුරහල ශාඛාවේ ගිණුම් අංක 167-1-001-6-3169425 වෙත බැර කිරීම.

b) **කොළඹ මහා නගර සභා සීමාව තුල පිහිටි පහත කාර්යාල පරිශ්‍රවල ගෙවීම් කවුළු වෙත සතියේ දිනවල පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා ගෙවීම් කිරීම.**

- **දිස්ත්‍රික් කාර්යාල අංක 04,** අංක 147, හයිලෙවල් පාර,කිරුළපන,කොළඹ 06.
- **ජල සම්පාදන හා අපවහන අංශය,** මාලිගාකන්ද, කොළඹ 10.

c) ටෙන්ඩර් ලියවිලි සමග මුදල් ගෙවූ ලදුපත අමුණා ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

**ක්‍රමය 02 – පුරහල ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගැනීම**

**a.** **කොළඹ මහා නගර සභාවේ කොළඹ 07, පුරහල පරිශ්‍රයේ පිහිටි නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුවේ ආදායම් අංශය වෙත සතියේ වැඩකරන දිනවල පෙ.ව.9.00 ත් ප.ව.3.00 අතර ලිඛිත ඉල්ලීමක් ලබා දී අයදුම්පත්‍ර ගාස්තුව වන රු 1080.00 ක් ගෙවීමෙන් ටෙන්ඩර් ලියවිලි ලබා ගත හැකිය.**

**b.** **නියමිත පරිදි සම්පූර්ණකර මුද්‍රා තබන ලද මුල් පිටපත සහ අනු පිටපත සහිත අයදුම්පත 2022.02...... දින පෙ.ව 10.00 ට පෙර කොළඹ 07, පුරහල පරිශ්‍රයේ නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය.**

**ටෙන්ඩර් විවෘත කිරිම**

1. **2022.02.11** දින පෙ.ව. **10.00** ට ටෙන්ඩර් භාර ගැනීම අවසන් වේ. ඉන් අනතුරුව වහාම නාගරික ලේකම් දෙපාර්තමෙන්තුවේදී ටෙන්ඩර් විවෘත කිරීම සිදු කරනු ලබන අතර ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට සහභාගී විය හැකිය.
2. මේ සම්බන්ධව වැඩි විස්තර කොළඹ 07, කොළඹ මහා නගර සභාවේ නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) හෝ ගණකාධිකාරී (ආදායම්) වෙතින් ලබා ගත හැකිය.( දු.අංක - 011-2692465 / 011-2699244)

## 2. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

1. ටෙන්ඩර් අයදුම්පතෙහි පිරවිය යුතු තොරතුරු පහත විස්තර වලින් සම්පූර්ණ කළ යුතුය.
    1. **ඉදිරිපත් කරන ටෙන්ඩර් මුදල අකුරින්.**
    2. **ඉදිරිපත් කරන ටෙන්ඩර් මුදල ඉලක්කමින්.**
    3. **ඉල්ලුම් කරන වෙළඳසැල පිහිටි පොදු වෙළඳපොළ.**
    4. **ඉල්ලුම් කරන වෙළඳසැල් අංකය.**
    5. **වෙළඳසැල් වර්ගය**
    6. **ටෙන්ඩර් කරුගේ ලිපිනය.**
    7. **ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ නම.**
    8. **ටෙන්ඩර්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය.**
2. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පතෙහි දැක්වෙන සම්පූර්ණ නම සහ වර්තමාන ලිපිනය සහ සක්‍රිය දුරකථන අංකයක් අනිවාර්යයෙන් ඉදිරිපත් ඉදිරිපත් කළ යුතුය.
3. එක් එක් වෙළඳසැල සඳහා වන අවම ටෙන්ඩර් මුදල මීට අමුණා ඇති උපලේඛනයෙහි එක් එක් වෙළඳසැල ඉදිරියෙන් දක්වා ඇත.
4. නියමිත අයදුම්පත්‍රය කළු හෝ නිල් කාබන් පෑනක් භාවිතයෙන් පමණක් සම්පූර්ණ කළ යුතු අතර, කිසියම් වෙනස්කමක් කිරීමට අවශ්‍ය වන්නේ නම් අදාල ස්ථානය තනි ඉරකින් කපාහැර, එහි තම කෙටි අත්සන යෙදිය යුතුය.කිසිඳු හේතුවක් මත පැන්සල් හා මකන දියර භාවිතයෙන් වැළකිය යුතුය.
5. පෝරමයෙහි ටෙන්ඩර් මුදල **<u>ඉලක්කමින් සහ අකුරින්</u>** යන දෙයාකාරයෙන්ම ඇතුලත් කල යුතු අතර, එහිදී ඉලක්කම් සහ අකුරු අතර කිසියම් නොගැලපීමක් පැවතියහොත් **අකුරින් සඳහන් කර ඇති මුදල** ටෙන්ඩර් මුදල් ලෙස පිළිගනු ලැබේ.
6. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරු විසින් පෞද්ගලිකව සම්පූර්ණ කර අත්සන් තබා තිබිය යුතුය.
7. සෑම ටෙන්ඩර් අයදුම්පත්‍රයක් ම <u>මුල් පිටපත සහ අනු පිටපත</u> වශයෙන් වෙන් වෙන් ව කවර වල දැමීම සිදුකළ යුතු අතර, එම කවර දෙක නැවත එක් කවරයක බහා **නාගරික කොමසාරිස් , කොළඹ මහා නගර සභාව, පුරහල, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්වීම හෝ නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.
8. එකී ලියුම් කවරයෙහි වම් පස ඉහල කෙළෙවරහි ඉල්ලුම් කරනු ලබන **වෙළඳ සැල් අංකය සහ වෙළඳ පොළෙහි නම** පැහැදිලිව සඳහන් කිරීම අනිවාර්යය වන අතර, සෑම ලිපි කවරයකම ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ද පැහැදිලිව සඳහන් කළ යුතුය.
9. **අයදුම්පත සමග පහත ලියවිලි ඉදිරිපත් කළ යුතුය.**
    1. තැන්පතු මුදල ගෙවන ලද රිසිට් පතේ මුල් පිටපත.
    2. අයදුම්පත් ගාස්තු ගෙවනලද රිසිට් පතේ මුල් පිටපත.
    3. ටෙන්ඩර්කරුගේ ලිපිනය තහවුරු කිරීම සඳහා ලියවිල්ලක්.
    4. ජාතික හැඳුනුම්පතේ පිටපතක්.

## 3. <u>ටෙන්ඩර් ඇගයීම</u>

1. එක් එක් වෙළඳසැල සඳහා ටෙන්ඩරය ලබා දෙනු ලබන්නේ ලැබී ඇති ඉහලම ටෙන්ඩර් මිළටය.

2. අසම්පූර්ණ හෝ අවශ්‍ය ලියවිලි ඉදිරිපත් නොකරන ලද අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. සෑම ටෙන්ඩරයක් සඳහා ම අයදුම්පතෙහි අමුණා ඇති උප ලේඛනයෙහි ඇති එක් එක් වෙළඳ සැල ඉදිරියෙහි සඳහන් කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල, මුදලින් ගෙවා ඊට අදාල ලදුපතේ මුල් පිටපත ඇමිණිය යුතුය. <u>**මේ සම්බන්ධව කිසියම් කඩකිරීමක් සිදුවුවහොත් එය ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීමට හේතුවනු ඇත.**</u>

4. මින් පෙර මීට අදාලව කොළඹ මහා නගර සභාව සමග වූ ටෙන්ඩර් ගිවිසුම් උල්ලංඝනය කරන ලද පුද්ගලයන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ටෙන්ඩර් කොන්දේසි කඩ කරමින් ඉදිරිපත් කර ඇති ඕනෑම ටෙන්ඩරයක් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. මෙම ටෙන්ඩරය ඉදිරිපත් කරන්නේ අවංක චේතනාවකින් නොවන බවට එත්තු ගියහොත් හෝ එවැනි ටෙන්ඩරයක් කොළඹ මහා නගර සභාවේ ඕනෑම වෙළඳපොළක හෝ එවැනි ස්ථානයක ලබාදීම සභාවේ මතයට අනුව ටෙන්ඩර්කරුගේ චරිතය හා ක්‍රියා පිළිවෙත් අනුව සුදුසු නොවන බව පෙනී ගියහොත් ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සභාව තබා ගන්නා අතර, එවැනි ප්‍රතික්ෂේප කිරිමක් පිළිබඳව හේතු දැක්වීමට සභාව බැඳී නොසිටී.

6. වෙලඳසැල් හිමියා හෝ නියෝජිත හෝ සේවකයා යනු බලපත්‍ර තබාගෙන ඇති තැනැත්තාය.

7. ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනිමේ හෝ ප්‍රතික්ෂේප කිරිමේ අවසාන තීරණය සභාව සතුවන අතර එයට සියළු කරුණු බැඳී පවතී.

4. <u>ටෙන්ඩරය පිරිනැමීම</u>

1. ටෙන්ඩරය පිළිගත් බව දැන්වීමෙන් දින 14 ක් තුල සම්පූර්ණ ටෙන්ඩර් ගාස්තුව මුදලින් ගෙවිය යුතුය.

2. ඉන් පසු නාගරික පශු වෛද්‍ය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ගිවිසුම්ගත වීම සඳහා මාස 06 ක කුලී මුදලට සමාන ආපසු ගෙවන තැන්පත් මුදලක් ද, විදුලි බිල්පත් නොගෙවා හිඟ මුදල් ඇතිවිට ඒවා අයකර ගැනිමට හැකිවන සේ රු. 25,000.00 ක මුදලක් ඇප තැන්පතුවක් ද, කොළඹ මහා නගර සභාව වෙත ගෙවිය යුතුය.

3. ගිවිසුම් ගතවී දින 14 ක් තුල වෙළඳසැලට අදාල ගිණුම විවෘත කිරීම සඳහා ගිවිසුමේ පිටපතක් හා ටෙන්ඩර්කරුගේ අනන්‍යතාවය තහවුරු කෙරෙන ලියකියවිලිද සහිතව නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුවේ ආදායම් අංශය වෙත භාරදීම ටෙන්ඩර්කරුගේ වගකීමකි.

4. එක් වෙළඳසැලක් සඳහා තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල වෙනත් වෙළඳසැලක් සඳහා භාවිතා කල නොහැකි අතර වෙළඳසැලක් සඳහා තැන්පත් කරන ටෙන්ඩර් මුදල අදාල වෙළඳසැල සඳහා පමණක් භාවිතා කළ යුතුවේ.

5. මෙම නිවේදනයෙහි අවශ්‍යතාවයන්ට තරයේම අනුගත වෙමින් ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට ප්‍රථම වලංගු ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද නමුත් තම ටෙන්ඩරය පිලිගෙන නොමැති සියලු පුද්ගලයින්ට ටෙන්ඩරය සඳහා ලබාදී ඇති තැන්පතුව ආපසු ලබා ගැනීමට හිමිකම ඇත.

6. සාර්ථක ටෙන්ඩර් කරුවකු අදාල ටෙන්ඩරය භාර නොගන්නේ නම්, ඊට අදාල තැන්පතු මුදල ආපසු ලබාගැනීමට හිමිකම් නොලබයි. මෙම තැන්පතු මුදල ආපසු ලබා ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කිරීමෙන් පසු **<u>මාස 06 ක් තුල</u>** ඉල්ලා සිටිය යුතුය. එම කාලය තුල ඉල්ලීම් ඉදිරිපත් නොවන සියළු තැන්පතු ආදායම වෙත බැර කරනු ලබන අතර , ආපසු ගෙවන ලෙස පසුව කරනු ලබන ඉල්ලීම් පිළිබඳව සලකා බලනු නොලැබේ.

7. මෙම මුදල ආපසු ගෙවීම සඳහා පහත ලියවිලි ඉදිරිපත් කළ යුතුය.
   1. තැන්පතු මුදල ආපසු ගෙවන ලෙස ඉල්ලීමක් සහිත ලිපියක්.
   2. තැන්පතු මුදල ගෙවූ රිසිට්පතේ පිටපතක්.
   3. ජාතික හැඳුනුම්පතේ පිටපතක්.
   4. ටෙන්ඩර්කරුගේ බැංකු විස්තර සහිත පාස් පොතක පිටපතක් හෝ බැංකු ප්‍රකාශනයක පිටපතක්.

## 5. <u>කුලී ගෙවීම</u>

1. වෙළඳසැල පවරා දීමෙන් මාස 03 ක් තුල අදාල වෙළඳසැලේ කටයුතු ආරම්භ කළ යුතු අතර, ගිවිසුම් අත්සන් කළ දින සිට ක්‍රියාත්මක වන පරිදි කුලී මුදල් ගෙවිය යුතුය.

2. ටෙන්ඩර් තැන්පතු මුදල ගෙවීමෙන් පසු වෙළඳසැල ආරම්භ කිරීම ප්‍රමාද කිරීම මත පැන නගින සියළු ගැටළු හා අලාභ කුලී කරු විසින් ම දරා ගත යුතු අතර, කිසිදු හේතුවක් මත විවෘත නොකරන ලද වෙළඳසැලක ටෙන්ඩර් මුදල ආපසු ගෙවනු නොලැබේ.

3. මාසික කුලී මුදල ඊළඟ මස 10 වන දිනට ප්‍රථම නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුවේ ආදායම් අංශය වෙත ගෙවිය යුතු අතර, මාස 03 කට වඩා හිඟ හිට ඇති කුලී සහිත වෙළඳසැල් <u>මුද්‍රා තැබීමට</u> කටයුතු කරනු ඇත.

4. වර්ෂයට අදාල සියළු මුදල් දෙසැම්බර් 31 වන දිනට පෙර ගෙවා අවසන් කළ යුතු අතර දෙසැම්බර් 31 දිනට හිඟ කුලී ගෙවා නොමැති නම්, එදිනට පවතින සියළු හිඟ ශේෂ සඳහා 20 % ක දඩ මුදලක් ද හිඟ කුලී මුදලට එකතු කරනු ලබයි.

5. වාර්ෂිකව, මාසික කුලී මුදලට 5% ක මුදලක් එකතු කර, ඊළඟ වර්ෂයේ මාසික කුලිය ගණනය කරනු ලබන අතර, වර්ෂ 5 කට වරක් සම්පූර්ණ කුලී සංශෝධනයක් සිදුකිරීමට යටත් වේ. එසේ කුලී සංශෝධනය කරනු ලබන අවස්ථාවේ දී, රඳවා ඇති මාස 06 කට සමාන කුලී ආරක්ෂණ තැන්පතු මුදල නව කුලී මුදල අනුව ගැලපීමෙන් ඉතිරි මුදලද කුලී ආරක්ෂණ තැන්පතු මුදල යාවත්කාලීන වන සේ ගෙවිය යුතුය.

## 6. බලපත්‍ර නිකුත් කිරීම

1. ලබාදී ඇති වෙළඳසැල් තුල වෙළඳාම් කටයුතු කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් එක් එක් වෙළඳසැල සඳහා වාර්ෂිකව බලපත්‍රයක්, සාර්ථක ටෙන්ඩර්කරු විසින් ලබාගත යුතුය. මෙම බලපත්‍රය එකී වර්ෂයෙහි දෙසැම්බර් 31 දින දක්වා වලංගු වනු ඇත.

2. ඊළඟ වර්ෂයට අදාල බලපත්‍රය ලබා ගැනීම සඳහා වූ අයදුම්පත පෙර වර්ෂයේ ඔක්තෝබර් 31 දිනට පෙර ලබා ගත යුතු අතර, අදාල වර්ෂයේ ජනවාරි 31 දිනට පෙර බලපත්‍රය ලබාගැනීමට කටයුතු කළ යුතුය.

3. තමන්ට ලබා දී ඇති වෙළඳපොළවල් වල වෙළඳාම් කිරීමේදී සභාවේ අතුරු ව්‍යවස්ථා , පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත හෝ අදාල වන යම් නීතියක් යටතේ වන කිසියම් වරදක් සඳහා අධිකරණයන් මගින් වැරදිකරු කර තිබෙනවානම් එවැනි පුද්ගලයෙකු වෙත නිකුත් කර ඇති බලපත්‍ර අවලංගු කරනු ඇත.

4. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු වෙත නිකුත් කර ඇති බලපත්‍රයක් වෙනත් අයෙකුට මාරු කළ නොහැකි අතර කිසිඳු හේතුවක් මත තෙවන පාර්ශවයක් වෙත ලබා දීම නොකළ යුතුය .

## 7. සාමාන්‍ය කොන්දේසි

1. ටෙන්ඩරය සඳහා කලින් කලට අවශ්‍ය වන කොන්දේසි කිසිවක් වෙතොත් ඒවා පැණවීමේ අයිතිය සභාව රදවා ගන්නා අතර එසේ පනවනු ලබන අමතර කොන්දේසි වලට ටෙන්ඩර්කරු බැදෙනු ඇත.

2. සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන අවශ්‍යතාවයන්ට සහ කොන්දේසි වලට ටෙන්ඩර්කරු අනුගත විය යුතුය.

3. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට පෙර, තමා ටෙන්ඩර් ඉදිරිපත් කරන වෙළඳසැලෙහි භෞතික තත්වය හා අනෙකුත් පහසුකම් පිලිබඳව හා තමා ටෙන්ඩර් කරන වෙළදපොළෙහි තත්වය පිළිබද ව ද , ටෙන්ඩර්කරුවන්ට අවබෝධයක් තිබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

4. භෞතිකව වෙළඳසැල පරික්ෂාකිරීමෙන් අනතුරුව එහි පවත්නා තත්වය පැහැදිලි අවබෝධයකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු අතර ම වෙළඳසැලෙහි සිදුකළ යුතු අළුත්වැඩියා කිරීම් වෙළඳසැල ලබා ගන්නා පුද්ගලයා විසින් ම සිදුකරගත යුතු ය.

5. ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු කිසිඳු හේතුවක් මත ටෙන්ඩර් මුදල් හෝ අළුත්වැඩියා වියදම් ආපසු ගෙවීමක් හෝ කුලී සංශෝධනයක් හෝ වෙනත් ආකාරයේ වූ අලාභ හෝ වියදම් ප්‍රතිපූර්ණය කිරීමක් හෝ අඩුකිරීමක් සඳහා ඉල්ලුම් කිරීමට ටෙන්ඩර්කරුට හිමිකමක් නැත.

6. කිසිදු හේතුවක් මත , මෙම වෙළඳසැල් තෙවන පාර්ශවයක් වෙත කුලී පදනම මත හෝ වෙන යම් ආකාරයකින් තෙවන පාර්ශවයක් වෙත පවරාදීම හා ආදායම් උපයා ගැනීම නොකළ යුතු අතර, එය වෙළඳසැල ආපසු පවරා ගැනීමට හේතු වනු ඇත.

7. කුලී පදනම මත දෙවන පාර්ශවයක් වන ටෙන්ඩර් කරු වෙත පවරන ලද්දේ වුවද, මෙම දේපළ කොළඹ මහා නගර සභාව සතු දේපළක් බැවින් ඕනෑම අවස්ථාවක සභාවේ තීරණය මත ආපසු පවරාගැනීම සම්බන්ධයෙන් තීරණයක් ගත හැකි අතර, ගිවිසුම්ගත කාලසීමාව තුල කුලී අයිතිය වෙනත් අයෙකුට පැවරීම සම්බන්ධයෙන් අනුමැතිය ලබාදීම හෝ තීරණය කිරීම සම්බන්ධව ද තීරණය කිරීමේ සම්පූර්ණ අයිතිය කොළඹ මහා නගර සභාව හා බස්නාහිර පළාත් සභාව සතු වේ.

8. ටෙන්ඩර්කරු විසින් සිය වෙළඳපොළ ටෙන්ඩරය පිළියෙළ කිරීමේදී හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් ටෙන්ඩර්කරුට දැරීමට සිදුවන කිසිදු වියදමක් සම්බන්ධයෙන් සභාවෙහි වගකීමක් නොමැත.

9. ඉදිරිපත් කර ඇති ටෙන්ඩරයෙහි ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බව පෙනීගියහොත් ටෙන්ඩරය ප්‍රතික්ෂේප කර තැන්පතුව අහිමි කරනු ඇත.

**8. <u>විශේෂ කරුණු</u>**

ටෙන්ඩර් ලියවිලි ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවෙන් සිට ටෙන්ඩර් තැන්පතුව ගෙවීමෙන් පසු ටෙන්ඩර් ලියවිලි ඉදිරිපත් නොකිරීමට තීරණය කර ඇති හා **2022.02.11** දින පෙරවරු **10.00** ට පෙර ටෙන්ඩර් බාර ගැනීම අවසන් කිරීමට ප්‍රථම ටෙන්ඩර් පෙට්ටියට තැන්පතු රිසිට් පත ඇතුලු සියළු ටෙන්ඩර් පත් බහා නොමැති ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් තැන්පතුව ආපසු ලබාගැනීමට හිමිකම් ඇත.

නාගරික කොමසාරිස්

කොළඹ මහා නගර සභාව

DUPLICATE

# ටෙන්ඩර් අයදුම්පත්‍රය

**කොළඹ මහා නගර සභාව – නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව**

**පොදු වෙළඳපොළවල වෙළඳසැල් කුලී පදනම මත ලබාදීම සඳහා ටෙන්ඩර් කැඳවීම.**

..............................................පොදු වෙළඳපළ - අංක ............... දරණ ..........................වෙළඳසැල

ඉහත සඳහන් පොදු වෙළඳපොළ වෙළඳසැල් වසර 10 ක් සඳහා කුලී පදනම මත ලබා ගැනීම සඳහා වූ ටෙන්ඩර් ලියකියවිලි කියවා බැලීමෙන් පසු ඊට අනුකූලව පනවා ඇති කොන්දේසි පරිදි රු.....................................................................................(1) (රු ................................(2) ක් වූ ටෙන්ඩර් ගාස්තුවක් මත, කොළඹ මහා නගර සභාවට අයත් ................................................(3) පොදු වෙළඳපොළ අංක .............................(4) දරණ .............................(5) වෙළඳසැල, කුලී පදනම මත ලබා ගැනීම සඳහා .....................................................................................................(6) හි පදිංචි ..................................................................................................................(7) වන මා (...............................................(8) විසින් ටෙන්ඩර් ඉදිරිපත් කරමි.

5. මා මෙම ටෙන්ඩරය ඉදිරිපත් කරනු ලබන්නේ මා වෙනුවෙන් විනා වෙනත් අයෙකුගේ නාමිකයෙකු හෝ නියෝජිතයෙකු වශයෙන් නොවන බව මා මෙයින් ප්‍රකාශ කර සිටිමි.
6. මා විසින් පිටු අංක 02 සිට 05 දක්වා වූ ටෙන්ඩරයේ කොන්දේසි හා උපදෙස් කියවා දැනුවත් වූ අතර, මා වෙත ටෙන්ඩරය ප්‍රදානය කරන ලද්දේ නම්, වර්ෂ 10 ක කාලයක් සඳහා මෙම කොන්දේසි වලට අදාලව, ඒවායින් සම්පූර්ණයෙන්ම බැඳීමට මාගේ කැමැත්ත ප්‍රකාශ කර සිටිමි.
7. මෙම ටෙන්ඩර් කටයුත්තට අදාලව අවසාන තීරණය ගැනීම කොළඹ මහා නගර සභාව සතු බව මා දැනුවත් බව ද, ඊට එකඟ බව ද ප්‍රකාශ කරමි.
8. මා විසින් මෙම ටෙන්ඩරයෙහි ලබා දී ඇති සියලු තොරතුරු සත්‍ය සහ නිවැරදි වන අතර, මා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සාවද්‍ය වන්නේ නම්, එය මාගේ ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීමට හේතුවන බව මම හොඳාකාරව දනිමි.

ටෙන්ඩර්කරුගේ අත්සන ..........................................................................................

දිනය ........................................... දුරකථන / ෆැක්ස් අංක ....................................

**<u>සාක්ෂි</u>**

| | |
|---|---|
| 1. ......................................................... | 2. ......................................................... |
| නම ......................................................... | ......................................................... |
| ලිපිනය ......................................................... | ......................................................... |